# කර්මාන්ත අමාත්‍යාංශය

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

# ඇබෑර්තු

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම යනු පූර්ණ වශයෙන් රජයට අයත්, ලාභ උපදවන හා ස්වයං අර්ධලාභී, ශ්‍රී ලංකාවේ රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන හා අලෙවි කරන ආයතනයක් වේ. එහි පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් අයවලුන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යන්තර විගණක තනතුර (MM 1-1) - තනතුරු 01

**තනතුරු සඳහා වන වගකීම් :**

සියලුම අදාලවන නියෝග හා රෙගුලාසි සමග අනුකූල වෙමින් මෙහෙයුම් ඵලදායිත්වය, මූල්‍ය විශ්වසනියත්වය මත අවදානම් කළමනාකරණය හා පාලන කළමනාකරණය ඇතුළත්ව පූර්ණ විගණන චක්‍රයක් ඉටුකරමින් පාලනය කළ යුතුය.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණ / මූල්‍ය / වාණිජ්‍ය උපාධියක් හෝ ගණකාධිකරණ හෝ මූල්‍ය විශේෂඥතාවයේ ව්‍යාපාර පරිපාලන හෝ ව්‍යාපාර කළමනාකරණ උපාධියක්

    සහ

    ප්‍රථම උපාධිය ලබාගත් පසු, තනතුරට අදාළ ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර එකක පළපුරුද්ද

02. පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍ය විභාගය සමත්වීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර එකක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නැත)

**වැටුප් පරිමාණය :**

MM 1-1-2016 රුපියල් (53,175 - 10 x 1,375 - 15 x 1,910 = 95,575)

**මූලික වැටුප :**

රුපියල් 53,175/- ජීවන වියදම් අංක දීමනාව රුපියල් 7,800/- අයවැය දීමනාව රුපියල් 5,000/- ප්‍රවාහන දීමනාව රුපියල් 15,000 (මසකට)

**ඉහත තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

පත්කිරීමේ බලධාරීන් විසින් පත් කරනු ලබන තේරීම් සභාවක් විසින් පවත්වනු ලබන තරගකාරී විභාගයක් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සෑම අයදුම්කරුවකුම :**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii) තනතුරට අදාලව රාජකාරි ඉටුකිරීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන සේ ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අනෙකුත් ප්‍රතිලාභ**

මාසික පැමිණීමේ දිරිදීමනා හා වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ. සෞඛ්‍ය රක්ෂණාවරණය ආයතනයෙන් ලබාදේ.

ආයතනය විසින්, සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාර අරමුදල (ETF) සඳහා සේවකයාගේ මාසික වැටුපෙන්, පිළිවෙලින්, 15% හා 3% ක දායකත්වයක් ලබාදෙනු ලබන අතර, සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා තම වැටුපෙන් 10% ක දායකත්වයක් ලබාදිය යුතුය.

**අයදුම්කරනු ලබන පිළිවෙල :**

පූර්ණ ජීව දත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්, අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග වූ අයදුම්පත්, ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2022 අප්‍රේල් 28 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්කරනු ලබන තනතුර අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය සංස්ථා / පූර්ණ වශයෙන් රජය සතු සමාගම් වල අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම,**
**අංක 446, එල් 3,**
**ගාලු පාර, රත්මලාන.**
**0112324466 / 0112437556**
**www.pccl.gov.lk**